**විවිධ විදේශාධාර ව්‍යාපෘතිය (පාලම් 46 ක් ප්‍රතිසංස්කරණය කිරීම ) - 2017**

------------------------------------------------------------------------------------

විවිධ විදේශාධාර යටතේ පාලම් 46 ක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වූ ව්‍යාපෘතියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ප්‍රංශ නැටික්සිස් බැන්ක් ඔෆ් ෆ්‍රාන්ස් (NATIXIS Bank of France) සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය අතර එළඹි අංක බී92 0ඒ1 2012 නොවැම්බර් 05 දිනැති ණය ගිවිසුම යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම,අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

------------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශය වර්තමානයේ මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛණිජ සම්පත් සංවර්ධන සහ අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ ශ්‍රී ලංකාවේ වානේ පාලම් 46 ක් සපයා ඉදිකිරීමයි. ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය යූරෝ මිලියන 45.80 කට සමාන රු. මිලියන 7,564 ක් වන අතර ඉන් රු. මිලියන 3,642 කට සමාන යූරෝ මිලියන 22.05 මූල්‍යයනය කිරීම සඳහා ප්‍රංශයේ නැටික්සිස් (NATIXIS) බැංකුව එකඟවී තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2013 ජූලි 17 දින ආරම්භ කරන ලද අතර 2015 ජූලි 17 වන විට නිම කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ කටයුතු 2017 දෙසැම්බර් 31 දක්වා ක්‍රියාත්මකව පැවතුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමත්, වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත්වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින්

ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කරන වියදම් ව්‍යාපෘතිය පවත්වාගෙන යන වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සැඟීමට පත්වන පරිදි සැසඳීම කර තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගතවූ වත්කම් හා වගකීම්, ණය යටතේ මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේ ද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයන්ට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේ ද යන බව.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේ ද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වාදෙන ලද කරුණු නිවැරදි කරගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේ ද යන බව සහ,

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූලවූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, සහ මෙම වාතීාවේ 2.2 ඡේදයෙන් දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැරුණු විට මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වාදෙන ලද කරුණු නිවැරදි කරගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගණකාධිකරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) කටුකුරුන්ද - නෑබොඩ මාර්ගයේ අංක 3/10 , හිනිදුම - ඕපාත - පිටබැද්දර මාර්ගයේ අංක 4/8 දරණ පාලම්වලට අදාලව 2017 දෙසැම්බර් 31 දින වන විට මූල්‍ය ප්‍රකාශණවල කෙරීගෙන යන වැඩ යටතේ පෙන්වන පාලම් ඉදිකිරීම් පිරිවැය රු. මිලියන 1.9 කින් වැඩියෙන් දක්වා ඇත.

(ආ) 2017 දෙසැම්බර් 31 දින වන විට පාලම් 35 ක කොන්ත්‍රාත් වැඩ අවසන් කර මාර්ග සංවර්ධන අධිකාරියට භාරදී තිබුණා වුවත් ,එකතුව රු. මිලියන 4,500 ක් වූ එහි පිරිවැය ව්‍යාපෘතියේ වත්කමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල කෙරීගෙන යන වැඩ යටතේ පෙන්වා තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

ව්‍යාපෘති මූල්‍යායනය, සමාලෝචිත වර්ෂයේ අයවැය ප්‍රතිපාදන හා සමාලෝචිත වර්ෂය තුල අරමුදල් උපයෝජනය හා 2017 දෙසැම්බර් 31 දක්වා අදාල වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂයේ අයවැයගත ඇස්තමේන්තු ප්‍රතිපාදනය | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුල | | 2017 දෙසැම්බර් 31 දක්වා | |
| | යූරෝ මිලියන | රු. මිලියන | රු. මිලියන | යූරෝ මිලියන | රු. මිලියන | යූරෝ මිලියන | රු. මිලියන |
| ප්‍රංශයේ නැටික්සිස් බැංකුව | 22.05 | 3,642 | - | - | - | 21.82 | 3781.00 |
| ශ්‍රී ලංකා රජය | 23.75 | 3,922 | 280.00 | 1.51 | 276.21 | 15.19 | 2773.00 |
| | 45.80 | 7,564 | 280.00 | 1.51 | 276.21 | 37.01 | 6554.00 |

**3.2 භෞතික කාර්යසාධනය**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** ව්‍යාපෘතිය 2012 නොවැම්බර් 05 දින ණය ගිවිසුමට එළඹී තිබුණා වුවත් පාලම් ඉදි කිරීමේ කටයුතු 2013 ජූලි ආරම්භ කර තිබුණි.කෙසේ වෙතත් අනෙකුත් පාලම්වල ඉතිරි කිරීම් භාවිතා කරමින් ඉදි කිරීමට අපේක්ෂා කරන ලද අමතර පාලම් 4 ක් සමඟ පාලම් 50 ක ඉදි කිරීම් 2017 දෙසැම්බර් 31 දිනදී අවසන කර තිබුණි.එය 2015 ජූලි අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

**3.3 කොන්ත්‍රාත්තු පරිපාලනය**

---

ලද තොරතුරු අනුව පාලම් 23 ක කොන්ත්‍රාත් වැඩ දින 29 සිට දින 455 ක කාල පරාසයක ප්‍රමාදයක් සහිතව රුපියල් මිලියන 335.57 ක පිරිවැයකට නිම කර තිබුණි.කෙසේ වෙතත් පාලම් කොන්ත්‍රාත් වැඩ නිම කිරීමට කාලය දීර්ඝ කිරීම් ලබාදීමේ ප්‍රතිඵලයක් ලෙස පාලම් 9 කට අදාල ප්‍රමාද ගාස්තු ප්‍රමාණය රපියල් මියන 40.78 ක් නිදහස් කර තිබුණි.තවද කටුකුරුන්ද - නෑබොඩ මාර්ගයේ අංක 12/3 පාලමේ සහ ඉංගිරිය - හලාවත - එගල්ඔය මාර්ගයේ අංක 5/4 පාලමේ කොන්ත්‍රාත් වැඩ පිළිවෙළින් දින 127 ක් සහ දින 58 ක් ප්‍රමාදයක් සමඟ නිම කර තිබුණු අතර කොන්ත්‍රාත් ගිවිසුමේ අංක 49.1 උප වගන්තිය යටතේ ඒ සඳහා කාලය දීර්ඝ කිරීම සඳහා අනුමැතිය ලබාගැනීමක් හෝ ප්‍රමාද ගාස්තු අයකිරීමක් සිදු කර නොතිබුණි.

**3.4 ඉඩම් අත්පත් කර ගැනමේ ක්‍රියාකාරකම්**

---

ලද තොරතුරු අනුව ඉඩම් කැබලි 288 ක් අත්පත් කර ගැනීමට සැලසුම් කර තිබූ අතර එම ඉඩම් වලින් ඉඩම් අත්පත් කර ගැනීමේ හා නැවත පදිංචි කිරීමේ පනතේ 17 වන වගන්තතිය යටතේ ඉඩම් කැබලි 62 ක් සඳහා නොතීසි නිකුත් කර ඇති අතර රුපියල් මිලියන 19.31 ක් වන්දි ගෙවීම් පියවා ඇත.කෙසේ වෙතත් 2017 දෙසැම්බර් 31 දින වන විට ඉඩම් කැබලි 55 ක් සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ හා නැවත පදිංචි කිරීමේ පනතේ 44 වගන්තිය යටතේ ඉඩම් කැබලි 3 ක අයිතිය 2017 දෙසැම්බර් 31 වන විට අදාල ප්‍රාදේශීය ලේකම් වරුනට පමණක් පැවරී තිබුණි.